# බෞද්ධ චර්යාවාදී ප්‍රතිකාර ප්‍රවේශය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. එම්. එල්. හර්ෂිකා බංඩාර දසනායක[1]

## හැඳින්වීම

මානවයා කිසියම් අයුරකට ස්වාභාවිකව ම ක්‍රියාකාරී ය. මෙම ක්‍රියාකාරී බව විවිධ අවස්ථාවන් සළකා බලමින් චර්යා වශයෙන් චර්යාවාදීන් අර්ථ දක්වා තිබේ. ඔවුන් වැඩි දුරටත් සිදුකරන ලද පර්යේෂණවලින් ඉගැනීමෙන් චර්යා වෙනස් කළ හැකි බවත්, ඉගෙනීමෙන් චර්යා උගනිත බවත් පුහුණුව තුළින් පවත්වාගෙන යන බවත් ආදී වශයෙන් චර්යාවක මූලික ස්වරූපය පැහැදිලි කර තිබේ. මේ අනුව චර්යාවාදයේදී මනෝවිද්‍යාඥයන් පුද්ගලයාගේ චර්යාව නිරීක්ෂණය කරමින් නිගමනයන්ට එළඹෙන නමුත් බුදුදහම පුද්ගල චර්යාවට හේතුවන අභ්‍යන්තර කරුණු පිළිබඳ අවධානය යොමු කරවයි.

පුද්ගලයෙකු තුළින් බාහිරට ප්‍රදර්ශනය වන චර්යාවෙහි මූලය පුද්ගල මනස බව බෞද්ධ ඉගැන්වීම් තුළින් හඳුනාගත හැකිය. ඒ අනුව පුද්ගලයා දක්වන සෑම චර්යාවකට ම මනස මූලික වන බව බෞද්ධ චර්යාවාදී ප්‍රවේශයේ මූලික ඉගැන්වීම වශයෙන් ගත හැකිය. මෙය තවදුරත් ගැඹුරින් විග්‍රහ කරන බුදුදහම පුද්ගල චර්යාව ක්‍රියාව හෙවත් කර්මය වශයෙන් දක්වමින් පුද්ගලයා චර්යාවන් සිදුකරන ප්‍රධාන මාධ්‍ය ත්‍රිත්වයක් පෙන්වාදෙයි. බුදුදහමෙහි තිදොර වශයෙන් සඳහන් වන්නේ එයයි. මේ පිළිබඳ වඩාත් ගැඹුරින් මෙම පර්යේෂණය තුළින් සාකච්ඡා කිරීමට නියමිත ය.

පුද්ගලයාගේ පවතින වැරදි චර්යා සඳහා ප්‍රතිකාර ප්‍රවේශයන් ද බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් මතුකර දැක්විය හැකිය.එහි විශේෂත්වය වන්නේ බටහිර මනෝවිද්‍යාඥයන් මෙතෙක් නුදුටු පුද්ගල චර්යාවන්ට හේතුවන සාධක මැනවින් බෞද්ධ ක්‍රමවේදය තුළින් හඳුනාගැනීමට ලැබීමයි. විශේෂයෙන් ම පුද්ගලයෙකු තුළ පවතින අයහපත් චර්යාවක් බෞද්ධ චර්යාවාදී ප්‍රතිකාර ක්‍රමය මගින් වඩාත් සාර්ථකව ඉවත් කළ හැකිවීම සුවිශේෂී වේ. එබැවින් මෙම පර්යේෂණය තුළින් පුද්ගලයාගේ වැරදි චර්යාවන් නිවැරදි කිරීමට බෞද්ධ චර්යාවාදී ප්‍රවේශයේ උපයෝගීතාවය කෙබඳු ද යන්න පරීක්ෂාවට ලක් කෙරේ.

[1] සහාය කථිකාචාර්ය, රුහුණ විශ්වවිද්‍යාලය, dmharshika@gmail.com

**පර්යේෂණ ගැටලුව**

බටහිර මනෝවිද්‍යාඥයන් පුද්ගල චර්යාවන් අධ්‍යයනය කරමින් විවිධ නිගමනයන් ඉදිරිපත් කර ඇත. එමෙන් ම චර්යාවන් බාහිර වශයෙන් පාලනය කිරීමට පමණක් විවිධ ක්‍රමවේදයන් හා න්‍යායන් ඔවුන් යෝජනා කර ඇත. නමුත් එය තාවකාලික බැවින් ප්‍රමාණවත් නොවේ. එකී ගැලුව නිරාකරණය කිරීම විෂයෙහි බෞද්ධ චර්යාවාදී ප්‍රතිකාර ප්‍රවේශයක් මෙතෙක් ඉදිරිපත් නොවීම ගැලුවක් වශයෙන් මෙම පර්යේෂණයේදී හඳුනාගත හැකිවිය. පුද්ගලයා පිළිබඳ ඉතා ගැඹුරින් විග්‍රහ කෙරෙන බුදුදහම තුළ පුද්ගලයාගේ චර්යාවන් යහපත් අයුරින් වෙනස් කිරීමට අදාළ බෞද්ධ ඉගැන්වීම් හඳුනාගත හැකිමුත් ඊට අදාළ ප්‍රවේශයක් Buddhist Approach මෙතෙක් ඉදිරිපත් නොවීම ගැටලුවක් වශයෙන් හඳුනාගෙන තිබේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

උක්ත කරුණ යටතේ සිදුකෙරෙන මෙම පර්යේෂණය විශේෂයෙන් ම ත්‍රිපිටකය, අටුවා ආදී ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරු කරගනිමින් මෙන්ම බටහිර මනෝවිද්‍යාවට අදාළ ද්විතීයික ප්‍රාමාණික මූලාශ්‍රය ද අන්තර්ජාල තොරතුරු ද උපකාරීකර ගනිමින් දත්ත එක්රැස් කරමින් ඒවා විශ්ලේෂණය කරමින් අදාළ නිගමනයන් ඉදිරිපත් කිරීමට නියමිත ය.

**පර්යේෂණ අරමුණු**

ඉහත සඳහන් පර්යේෂණ මාතෘකාව සම්බන්ධව බෞද්ධ ඉගැන්වීම් ආශ්‍රයෙන් ගැඹුරු විමර්ශයක් සිදු වී නොමැත. එබැවින් බටහිර මනෝවිද්‍යාඥයන් ඉදිරිපත් කරන පුද්ගල චර්යාවාදී ප්‍රතිකාර ප්‍රවේශයට එහාගිය වඩාත් සාර්ථක බෞද්ධ ප්‍රවේශයන් හඳුන්වාදීමට නියමිත ය. එමෙන් ම විවිධ මානසික ගැටලු හේතුවෙන් පීඩා විඳින පුද්ගලයන්ට වඩාත් සාර්ථක ප්‍රතිකාර ක්‍රමයක් ලෙස මෙම බෞද්ධ චර්යාවාදී ප්‍රතිකාර ප්‍රවේශය හඳුන්වාදීම ද මූලික අරමුණකි.

**නිගමනය**

බෞද්ධ චර්යාවාදී ප්‍රතිකාර ප්‍රවේශයක් Buddhist Behavior Approach හඳුන්වාදීමට නියමිත ය. එමෙන් ම පුද්ගල ගැටලුවක දී බෞද්ධ චර්යාවාදී ප්‍රවේශය භාවිත කළහැකි බව හේතු සාධක සහිතව නිගමන හා යෝජනා වශයෙන් ඉදිරිපත් කිරීමට ද අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පද:** චර්යාවාදය, බෞද්ධ චර්යාවාදය,

## ආශ්‍රිත ග්‍රන්ථ


අංගුත්තර නිකාය. විචිකිච්චප්පහාන සූත්‍රය, සාරිපුත්ත සූත්‍රය, යොනිසොමනසිකාර සූත්‍රය. (2005). බු. ජ. ත්‍රි., දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ධම්මපද විවරණය.* (2004). සංස්කරණය: මොරගල්ලේ සිරි ඤාණෝභාසතිස්ස.

බණ්ඩාරනායක, අභය, *මනෝවිද්‍යා ප්‍රවේශය,* කොට්ටාව: සාර ප්‍රකාශන.

හපුආරච්චි, ගාමිණී. (2013). *ව්‍යවහාරික මනෝවිද්‍යා ලිපි.* දොම්පෙ, ඉද්දමල්දෙණිය: විනිවිද ක්‍රියේෂන්ස්.

පෙරේරා, ඥානදාස. (2005). *මනෝ ප්‍රතිකාර.* කොළඹ 10: සහස්‍ර මුද්‍රණාලය.

ජයතුංග, එම්., රුවන්. (2005). *මනෝවිද්‍යාත්මක උපදේශනය සහ මනෝ ප්‍රතිකාරය.* පොල්ගස්ඕවිට: සිකුරු ප්‍රකාශකයෝ.